# මිතුරන් දෙදෙනා සහ රත්තරන් දොරමුවේ අභිරහස



මිනෝද්‍යා සිතුළි රත්නායක

# මිතුරන් දෙදෙනා සහ රත්තරන් දොරටුවේ අභිරහස

## මිනෝද්‍යා සිතුලි රත්නායක

# මිතුරන් දෙදෙනා සහ රත්තරන් දොරටුවේ අභිරහස

## කතා ප්‍රකාශනයකි.

කතෘගේ වෙනත් කෘති

1. හොඳ යාළුවෝ දෙන්නා - 2019
2. අහංකාර කුමාරිය - 2020

ඉගෙනුම ලබන

පංතිය - 9 ශ්‍රේණිය C

පාසල - මහමායා බාලිකා විදුහල

ප්‍රථම මුද්‍රණය - 2026

ISBN - 978-624-211-352-4

# පිදුම

## රහස් පරීක්ෂක කතා
## ප්‍රිය කරන
## පාඨකයන් හට



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# මිතුරන් දෙදෙනා
# සහ
# රත්තරන් දොරටුවේ අභිරහස

පාසල් නිමාවී ඇලෙක්ස් නිවසට පැමිණියේ ඉමහත් සතුටෙනි. ඒ ඔහුගේ උපන් දිනය තිබූ නිසාය. එදින ඔහුගේ යහළුවන් හා නෑදෑයින් පැමිණ ඔහුට සුභ පතා තෑගි බෝග ලබා දී සතුටින් රාත්‍රිය ගත කළේය.

පසුදා ඇලෙක්ස් පාසල් ගියේ එදිනට පැමිණෙන යහළුවා පිළිගැනීමේ උත්සවයට සහභාගී වන අදහසින්ය.

ඔහුගේ නම පීටර්. ඔහු ඉතා දක්ෂ සිසුවෙක් බව උත්සවය අමතා විදුහල්පතිතුමා පැවසුවේය. කාලය ගත වීමෙන් පීටර් මගේ හොඳම යාළුවා බවට පත් විය.

දවසක් ඇලෙක්ස් ගලක පැටලී වැටෙනු දුටු පීටර් වහා දුවවිත් ඇලෙක්ස්ව උස්සන් පුටුවකින් වාඩි කරවා ඔහුගේ තුවාල වලට බෙහෙත් දැම්මේ ය.

"ඇලෙක්ස් ඔයාට කොහොම ද?" පීටර් ඇසුවේය.

"මට දැන් ටිකක් අඩුයි."

"ඔයාට ගොඩාක් ස්තූතියි පීටර්" ඇලෙක්ස් කීවේය.

දිනක් "පීටර් ඔයා අපේ ගෙදර එනවද? අපි එකට සෙල්ලම් කරමු." ඇලෙක්ස් ඇහුවේය.

"ඒක හොඳ අදහසක්. හෙට මම එන්නම්" පීටර් කීවේය.

පසුදා සති අන්තයේ දිනයක් බැවින් පීටර් සෙල්ලම් කිරීමට ඇලෙක්ස්ගේ ගෙදර ගියේය.

ඇලෙක්ස් ඔහුව ආදරයෙන් නිවසට පිළිගෙන අම්මාටත් ඔහුව හඳුන්වා දී ඔවුන් සෙල්ලම් කිරීමට වත්ත පහළට ගියේය.

දවසම ඇලෙක්ස්ගේ නිවසේ කාලය ගත කළ පීටර් හවස්යාමේ ඔහුගේ නිවස බලා ගියේය. සැමදා පාසලට එකට මුණ ගැසී යෑමට ඔවුන් දෙදෙනා පුරුද්දක් කරගෙන තිබුණි.

දිනක් දෙදෙනා පාසලට යන අතරමඟදී වැටිලා තිබු කඩදාසියක් ඇහිද ගෙන හොඳින් නිරීක්ෂණය කළේය. දෙදෙනාටම එය හොඳින් බැලුවද කුමක්දැයි කියා තේරුම් ගැනීමට අපහසු විය.

දෙදෙනාම එය රැගෙන පාසලට ගියේය.

පන්තියේ වැඩ කළත් දෙදෙනාගේම සිත තිබුණේ උදෑසන හමු වූ කඩදාසිය ගැනයි.

පාසල් විවේක කාලය තුළ දී ඔවුන් නැවතත් එම කඩදාසිය පරීක්ෂා කළේය.

"ඇලෙක්ස් ඔය මොනවාගේ කඩදාසියක් ද?" පීටර් ඇසුවේය.

"පීටර් මට සිතෙන්නේ මේක සිතියමක කොටසක් කියලයි. ඉතිරි කොටස මෙතනින් ඉරිලා" ඇලෙක්ස් කීවේය.

දෙදෙනාම පාසල නිම වී විගස ගෙදර පැමිණියේ උද්‍යානය හමු වූ සිතියම ගැන සොයා බැලීමටය.

දහවල් කෑම ගත් පසු දෙදෙනාම සිතියම ගෙන හොඳින් පරීක්ෂා කර බැලුවේය.

ටික වේලාවකින් එය නිවසට යන පාරක් බව දෙදෙනාටම සොයා ගැනීමට හැකි විය.

පසුදා සති අන්තයේ දිනයක් බැවින් දෙදෙනාම මේ සිතියමේ පෙන්වා තිබූ නිවස සොයා යාමට කථිකා කර ගත්තේය.

පීටර් ඔහුගේ මවගෙන් අවසර රැගෙනවිත් එදින රාත්‍රිය ගත කළේ ඇලෙක්ස්ගේ නිවසේය.

පසු දිනට අවශ්‍ය සියලුම බඩු දෙදෙනාගේ බෑග් වලට අසුරා පසුවදා ගමනට සූදානම් එදින නින්දට ගියේය.

උදෑසන දෙදෙනාම ළඟි ළඟියේ සූදානම් ව දෙදෙනාටම සොයා ගැනීමට අභියෝගයක්ව තිබූ එම  නිවස සොයා යෑමට පිටත් විය.

කිලෝ මීටර් හතරක් පමණ දෙදෙනාම පයින් ඇවිද යන විට රූස්ස ගස් වලින් පිරුණු ඝන කැලෑවක් හමු විය.

දෙදෙනාගේම සිතට භයංකාර සිතිවිල්ලක් ඇති වුණ නමුත් සිත දැඩි කරගෙන හමු වූ සිතියමේ තිබූ නිවස සොයා යෑමට කැලෑව මැදින් ගමන් කිරීමට තීරණය කළේය. කැලෑව මැදින් හමා එන දැඩි සුලං පහර දෙදෙනාගේ සිත තවත් භිතියට පත් කළේය. මුළු පරිසරයම පාළු ස්වාභාවයක් ගත්තේය.

ටික දුරක් ගමන් කළ දෙදෙනාට දැක ගැනීමට හැකි වුණේ පාළුවට ගිය දිරා පත් වූ නිවසක්.

ටිකෙන් ටික නිවස අසලට පැමිණි දෙදෙනා සෙමින් නිවසේ දොර ඇරීමට උත්සාහ කළේය.

"චරස්" මෙන්න දොර ඇරුණා.

"අපි හෙමින් ඇතුලට යමු නේද? පීටර්, කෝ අපි ගෙනාපු ලාම්පුව පත්තුකරගෙන ගෙදර ඇතුලට යමු."

දෙදෙනාම සෙමෙන් වටපිට බලමින් නිවස තුලට ඇතුල් වුණි. මුළු නිවසම අඳුරු කුටියක් සේ පෙණුනේය. තැනින් තැන දිරාපත් වූ කසල ගොඩවල්ය.

දිරාපත් වූ වහල හා කැඩී තිබූ පුටු, මේස, වහලේ තැනින් තැන වවුලන්ගෙන් පිරී ඇත. දෙදෙනාම ටිකෙන් ටික නිවස තුලට ගමන් කළේය.

"පීටර් මේ බලන්න. මෙතන පොත් වගයක් තියෙනවා."

ඇලෙක්ස් මහ හඬින් කෑ ගැසුවේය.

පීටර් දුව විත් එහි තිබූ පොත් රැගෙන එකින් එක පිටු පෙරලුවේය. එහි දී ඔහුට නවා පොතක් තුලට දමා තිබූ තව කඩදාසියක් ලැබිණි.

"මෙන්න තව කොළයක් "

"ඇලෙක්ස් මේ බලන්න."

කඩදාසියේ ලියා තිබූ දෙය දෙදෙනාම පුදුමයට පත්විය. දොරටුව සොයා ගැනීමට නම් "හොවැංහෝ" නම් ඇති පොත ඉදිරියේ ඇති පොත් රාක්කයේ සොයා ගන්නා ලෙසය.

දෙදෙනා හමු වු කඩදාසියත් රැගෙන ඉදිරියට ගියේ කොළයේ ලියා තිබු පොත් රාක්කයෙ සොයා ගන්නා ලෙසය.

දෙදෙනා හමු වූ කඩදාසියත් රැගෙන ඉදිරියට ගියේ කොළයේ ලියා තිබු පොත් රාක්කය සොයා ගැනීමේ අදහසින්.

"මෙන්න තියෙනවා පොත් රාක්කය" ඇලෙක්ස් කිවේය.

"බලන්න බලන්න ඒ පොත කොහේ හරි ඇති අපි හොයමු" පීටර් කීවේය.

දුවිලි වලින් පිරුණු පොත් රාක්කයේ "හොවැංහෝ" නම සඳහන් පොත සොයා ගැනීමට දෙදෙනාටම මහත් අසීරු කටයුත්තක් විය.

"ඇලෙක්ස්  ඇලෙක්ස් මේ...." පීටර් කතා කළේය.

නියමයි පීටර් අපි වැඩේ කළා. ඇලෙක්ස් කීවේය.

"එහෙනම් දැන් අපි පොත කියවන්න පටන් ගමු."

කියවා යන විට වැටහුණේ අපට මුහුණ දීමට අභියෝග රාශියක් ඇති බවයි.

මුල්ම අභියෝගය වුණේ විශාල ගලක් යට යතුර සොයා ගැනීමටයි. දෙදෙනා හිඳ සිටි තැනින් නැගිටිනවාත් සමඟම දඩාං දෙදෙනාම පහලට ඇඳ වැටිණි.

"පීටර් පීටර් ඔයා කොහේ ද?"

"ඇලෙක්ස් ඔයා හොඳින් ද?"

"අපි කොහේට ද මේ කඩාගෙන වැටුණේ"

දෙදෙනා වැටුණු තැනින් නැගිට වට පිට බැලුවේය. පීටර් අතැතිව තිබූ ලාම්පුව නිවී කැඩී ගොස් ඇත. රැගෙන ආ විදුලි පන්දම පත්තු කළ ඇලෙක්ස් "පීටර් අපි කොහේද මේ ඉන්නේ" ඇසීය.

"මේ බලන්න ඇලෙක්ස් මෙතන තියෙන ගල මේක ගැන නේද අර කොළයේ ලියලා තිබුණේ"

"ඔව් ඔව් අපි එහෙනම් යතුර හොයමු." දෙදෙනා යතුර සෙවීමට ආරම්භ කළේය.

"ඇලෙක්ස් අර අර අතන බලන්න මොකක්ද දිලිසෙන්නේ කියලා"

"මෙන්න යතුර" ඇලෙක්ස්ට කෑ ගැසුණේය.

"හරි අපි අපේ පළමු අභියෝගයට මුහුණ දුන්නා"

පීටර් කීවේ මහත් සතුටිනි. දෙදෙනාම හමු වූ යතුරත් රැගෙන ඉදිරියට ගමන් කළේය. අඳුරු බිම් ගෙය මොනතරම් දුරකට තියේදැයි දෙදෙනාටම කියන්නට හැකියාවක් නොතිබුණි. දෙදෙනාගේම සිත් තුළ තිබුණේ දෙගිඩියාවකි.

ඉදිරියට පැමිණි දෙදෙනාට දැක ගැනීමට හැකි වුණේ කුඩා දොරටුවකි.

"මේ යතුරෙන් ඔය දොර අරිමු ද?" පීටර් කීවේය.

ඇලෙක්ස් දොරට යතුර දමා මහත් වෙහෙසක් දරා දොර ඇර ගත්තේය. සිතියමේ පරිදි දොර විවෘත කර නැවතත් දෙදෙනා ඉදිරියට ගමන් ගත්තේය. සිතියමේ පරිදි නිල් දිය පොකුණක් හමු විය යුතුය.

ඉදිරියට ගමන් කළ දෙදෙනාට ලස්සන නිල් පාට තිබෙන පොකුණ හමුවිය.

"අන්න බලන්න හරිම ලස්සනයි. අපි එතන ටික වෙලාවක් මහන්සි නිවා ගමුද? ඇලෙක්ස්."

"මෙතන හරිම ලස්සනයි. මම මීට කලින් මේ වගේ පොකුණක් දැකලා නෑ." පීටර් කීවේය. පීටර් එම පොකුණ අසල ඇති ගලක් උඩට නැග අහල පහල බැලුවේය.

"ජබොස් ................ පීටර් උඩ නැග සිටි ගල සමඟ වතුරට වැටුණේය."

"පීටර්, පීටර්" ඇලෙක්ස් මහ හයියෙන් කෑ ගැසුවේය.

ඇලෙක්ස්ට දැක ගැනීමට හැකි වුණේ පීටර්ව පොකුණ තුළට ඇඳ යනවා පමණි.

එය බලා නොසිට ඔහු පීටර්ව කෙසේ හෝ බේරා ගැනීමට සිතා ඔහුත් වතුරට පැන්නේය. ඇලෙක්ස් සහ පීටර් විශාල උමඟක් දිගේ පහළට ඇඳ ගියේය.

විශාල ජල පහරකින් දෙදෙනාම එකවර වැටුණේය.

"අපි මේ කොහේද ඉන්නේ" පීටර් ඇසුවේය.

“මට හරි මහන්සියි පීටර් අපි මෙතන ටිකක් ඉමුනේද?” ඇලෙක්ස් කීවේය.

දෙදෙනා වතුරෙන් ගොඩට පැමිණ මදක් විවේකයක් ගත්තේය. මිතුරන් දෙදෙනාටම ටික වේලාවක් නින්ද ගියේය. යමක් කකුලේ ගෑවෙනවා දැනුණු ඇලෙක්ස් වේගයෙන් නැගිට බැලුවේ කුමක් දැයි කියා.

“පිටර් පීටර් ඔතනින් අයින් වෙන්න”

ඔන්න නයෙක් මිතුරන් දෙදෙනා තමන් ගෙනා බෑග් රැගෙන ඉදිරියට දිව ගියේය. සිතියමේ පරිදි ඉදිරියට පඩිපෙළක් හමුවිය යුතුය. ටික දුරක් යනවාත් සමඟ එම පඩිපෙළ දැක ගැනීමට හැකි වුණි.

ඉන් බැස ගත් දෙදෙනා පහළට ගියේ ඊලඟට මුහුණ දීමට තිබෙන අභියෝග කුමක්දැයි සිතා.

පීටර් ........ ඇයි ඇලෙක්ස් මෙතනින් පහළට යන්න බැහැ පීටර් කීවේය. මෙතනින් පහළට බුබුළු දමමින් වතුර ඇති බව ඔවුන් දෙදෙනාටම නිරීක්ෂණය විය.

පීටර් කොහොමද? අපි මෙතනින් බහින්නේ ඇලෙක්ස් ඇසීය. දෙදෙනා එක්ව කල්පනා කළේය.

“ඉන්න මම බැහැලා බල්නම්” පීටර් කීවේය.

පීටර් හෙමිහිට වතුර සහිත පඩිපෙලෙන් බැසීය. ටිකෙන් ටික වතුර යටට ගිය පීටර් පෙනුනේ නැත.

"පීටර් .... පීටර්,"

කියා ඇලෙක්ස් කෑ ගැසුවත් පීටර්ට කටහඬ ඇසුනේ නැත. ටික වේලාවකට පසු පීටර් වතුර යට සිට උඩට පැමිණියේය.

"ඇලෙක්ස් ප්‍රශ්නයක් නෑ උඩ වතුර තිබුණාට යට වතුර නෑ" පීටර් කීවේය. දෙදෙනාම සෙමෙන් වතුරට බැස්සේය.

"පීටර් හරි පුදුමයි නේද?"

ඇලෙක්ස් චකිතයකින් විමසීය. දෙදෙනා සෙමෙන් සෙමෙන් ඉදිරියටම ගමන් කළේය.

"අර ..... අර " පීටර් ඇලෙක්ස්ට අත දිගු කර පෙන්නුවේය.

ලස්සන මල් ගස් වලින් පිරුණු පරිසරයක් ඔවුන් දෙදෙනාම දැක්කේය. සෙමෙන් සෙමෙන් ඔවුන් දෙදෙනා ඉදිරියටම ගමන් කළේය. ලා හිරු රැස් අතරින් දිප්තිමත් තැනක් ඇලෙක්ස් දුටුවේය.

"මොකක්ද ඒ... පීටර්" විමසීය. දෙදෙනාම එක්ව ඒ දීප්තිමත් ස්ථානයට ගමන් කළේය.

"ඇලෙක්ස් අන්න සිතියමේ තිබූ රන් දොරටුව නේද?"

පීටර් කෑ ගැසීය. දෙදෙනා ඉමහත් සතුටට පත් විය. අපි මේ දොර ඇරලා බලමු. ඇලෙක්ස් කීවේය.

"සිතියම අරගෙන අපි පොඩ්ඩක් කියවලා බලමු." පීටර් කීවේය.

හිරු එළිය පතිත වන දකුණු දෙසට වන්නට ගල් දෙබොක්කක් ඇතුළේ යතුර ඇති බව සඳහන් විය. ඒ අනුව ඔවුන් දෙදෙනා යතුර සොයා ගැනීමට හැකි වුණි.

ඉන් අනතුරුව ඔවුන් දෙදෙනා රන් දොරටුට විවෘත කිරීමට මහත් වෙහෙසක් දැරීය.

දොර සෙමෙන් ඇරුණේය. දෙදෙනා විවර කර ගත් දොරටුවෙන් ඇතුළට ගියේය. එය ඉතා කලුවර ස්ථානයකි.

පීටර් ඔය විදුලි පන්දම දල්වන්න. ඇලෙක්ස් කීවේය. පීටර් දැල්වූ පන්දම සෙමෙන් එහා මෙහා කර බැලුවේය.

"අර බලන්න, අර බලන්න,"

පීටර්....................

ඇලෙක්ස්ට කෑ ගැසීය. දීප්තිමත් තරු රටා මවමින් දැස් නිලංකාර වෙමින් සෑම තැනකම දිලිසෙන්නට පටන් ගත්තේය.

මුතු, මැණික්, රන් ආභරණ තැනින් තැන තැන්පත්කර ඇති බව ඔවුන් දැක්කේය. පීටර් ඔව් ඇලෙක්ස් අපි මොකද කරන්නේ දෙදෙනා මුහුණෙන් මුණ බලා ගත්තේය. මෙය අපට අයිති දෙයක් නොවේ.

අප දෙදෙනා මෙහි පැමිණියේ සිතියමේ තිබූ අභිරහස සොයා යෑමේ අරමුණෙන්ය. මෙය අප දෙදෙනා හැර වෙන කිසි කෙනෙක් මේ ගැන දැන ගත යුතු නැත. දෙදෙනාම තීරණය කළේය.

එහෙනම් පීටර් අපි මේ දොර වසමු. දෙදෙනාම එළියට පැමිණ තිබූ ලෙස දොර වසා මහත් ආඩම්බරයෙන් නැවත නිවෙස් කරා යාමට ගමන් ආරම්භ කළේය.

ඉතා දුෂ්කරගමනකින් පසු දෙදෙනා තම නිවෙස් අසලට පැමිණියේය.

පීටර් ඔව් ඇලෙක්ස් අපි මේ සිතියම විනාශ කරමු. මෙය අභිරහසක් ලෙස ඉදිරියටත් තිබුණාවේ. දෙදෙනාම තීරණය කළේය.

ඔවුන් දෙදෙනා සිතියම ගිනි තැබුවේය. එහෙනම් ඇලෙක්ස් මම යන්නම් සුභ රාත්‍රියක් පීටර්. දෙදෙනාම සතුටින් තම නිවෙස් කරා ගියේය.

අභිරහසක් ලෙස පවතින දේ අභිරහසක් ලෙස පැවතීම සැපගේ පැතුමයි.

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකරවීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල් නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස්වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් “හේමමාලා උපහාර” ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද, මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)